ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025** පෙබරවාරි **21** දින සංශෝධිත **2024** දෙසැම්බර් **16** දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** අනුව කාන්තා**,** ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ**,** මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා**,** මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කාන්තා**,** ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ**,** මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 14 ක් සඳහා සලසා ගෙන තිබූ ප්‍රතිපාදන වලින් සියයට 59 ත් සියයට 100 ත් අතර පරාසයක් තුළ ඉතිරිවීම් තිබුණි.	ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරියට අයත්වීම නිසා වැඩිදියුණු කිරීමට ගැටළු ඇතිවීම, අමාත්‍ය කාර්ය මණ්ඩලය ඉවත්වීම, 2024 ජනවාරි 10 දිනැති අංක 1/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව අත්‍යවශ්‍ය කටයුතු පමණක් සිදුකිරීම, වියදම් පාලනය, පුහුණු කාලසීමාවට අදාළ ගෙවීම් නොකිරීම, මැතිවරණ කාලසීමාවක් පැවතීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	මුදල් රෙගුලාසි **50 (ii)** අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරී විසින් වගබලා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	වාර්ෂික ඇස්තමේන්තු මගින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් වැය විෂයයන් 12 ක ප්‍රතිපාදන සියයට 14 සිට 100 දක්වා පරාසයක් තුළ වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. එමෙන්ම වැය විෂයයන් 13 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණද සියයට 13 සිට 75 දක්වා පරාසයක් තුළ එම වැය විෂයයන්ගේ ඉතිරිවීම් තිබුණි.	විදේශ ගමන් වියදම් අවශ්‍යතා පැන නොනැගීම, නිල ඇඳුම් හිමි නිලධාරීන් අඩුවීම, දේපල ණය ලබා ගැනීම අඩුවීම **2024** ජනවාරි **10** දිනැති අංක **1/2024** දරන අයවැය චක්‍රලේඛය අනුව වියදම් පාලනය කිරීම, නියමිත කාල වකවානු තුල බිල්පත් ඉදිරිපත් නොවීම යන හේතූන් මත ඉතිරිවීම් සිදු වී ඇති බව.	-එම-

(ඇ)	වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු. මිලියන 52.98 ක් වෙන්කර දී තිබුණද ප්‍රතිපාදනයෙන් සියයට 63 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව අවශ්‍යතාවයකින් තොරව ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණි.	පිළිතුරු ලබාදී නැත.	-එම-
(ඈ)	වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් මාරු කර තිබුණු අතර එම වැයවිෂයයන්ගේ ඉතිරිවීම් වලට 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් පාලනය කිරීම හේතුව ලෙස දක්වා තිබුණද, අධි ප්‍රතිපාදන සලසා ගැනීම/මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් වැඩියෙන් සිදු කිරීම, ඉතිරිවීම් වලට හේතු වී තිබුණි	**2024** ජනවාරි **10** දිනැති අංක **01/2024** දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් පාලනය කිරීම නිසා ඉතිරිවීම් සිදු වී ඇති බව.	මුදල් රෙගුලාසි **50** අනුව, හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන අතර, වියදම් එම වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා යන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සෑහීමට පත්වන අවස්ථාවලදී පමණක් මුදල් රෙගුලාසි **66** අනුව ප්‍රතිපාදන මාරුකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකු, විශ්‍රාම ගිය නිලධාරියෙකු හා මියගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාල වසර ඉක්ම වූ හිඟ ණය ශේෂය රු.මිලියන 0.9 ක් වී තිබුණි.	ඉදිරියේදී ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	හිඟ ණය ශේෂ අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකළ යුතු අතර, ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
වටිනාකම රු.මිලියන 3.76 ක්වූ බැරකම් 14 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් කර නොතිබුණි.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් බැරකම් ලේඛනයට ඇතුළත් කර නැති බව.	මුදල් රෙගුලාසි 94 අනුව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇතිකර ගැනීමට කටයුතු නොකළ යුතුය.

3.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 371 (5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද අවස්ථා 07 දී ලබාගත් එකතුව රු.මිලියන 0.2 ක්වූ අතුරු අග්‍රිම පියවීමට දින 14 සිට දින 25 දක්වා කාලයක් ගත කර තිබුණි.	ඉදිරියේදී ප්‍රමාදවීම් අවම කර ගනිමින් කටයුතු කරන ලෙස නිලධාරීන්ව දැනුවත් කර ඇති බව .	මුදල් රෙගුලාසි 371 (5) පරිදි අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුය.
(ආ)	රැකියා ස්ථානයේ ලිංගික හිංසන අවම කිරීම සඳහා කාන්තා කමිටුව විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආශ්‍රිතව හා වැඩබිම් ආශ්‍රිතව පවත්වනු ලබන කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාන්තාවන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම හා එමඟින් රැකියා ස්ථානයේ කාන්තා හිංසනය අවම කිරීම අරමුණු කරගත් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සංකල්ප පත්‍රිකාවට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී නොතිබුණු අතර එම වැඩසටහනට සහභාගීවන්නන්ගේ දැනුවත්භාවය පරීක්ෂා කිරීම සඳහා ඇගයීම් ක්‍රමයක්ද ස්ථාපිතකර නොතිබුණි. තවද, එම වැඩසටහන 2024 ජූනි අවසන් කිරීමට සැලසුම් කර තිබුනද දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක කර රු.මිලියන 0.4 ක වියදමක් දරා වැඩසටහන් 07 ක් පමණක් පවත්වා තිබුණි.	පිළිතුරු ලබාදී නැත.	වැඩසටහන් පැවැත්වීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවීම හා වැඩසටහනේ කාර්ය සාධනය ඇගයීම කාලීනව කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 23 දින පෞද්ගලික ආයතනයක පවත්වා තිබූ කාන්තා හිංසනය අවම කිරීම අරමුණු කරගෙන පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිණියක් සම්බන්ධවී නොතිබුණු අතර වැඩසටහනකට ඇස්තමේන්තු කළ මුදල රු.මිලියන 0.1 ක් වුවද මෙම වැඩසටහන සඳහා වියදම රු.මිලියන 0.14 ක් වී තිබුණි.	-එම-	ඇස්තමේන්තු වියදම ඉක්මවා වියදම් නොදැරිය යුතු අතර, අපේක්ෂිත සම්පත්දායකයින් සම්බන්ධකර වැඩසටහන් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික කාන්තා කමිටුවේ පස් අවුරුදු උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම යටතේ “සතුටු පවුල ව්‍යාපෘතිය” 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර අනාරක්ෂිත පවුල් හදුනා ගැනීමට 1938 කාන්තා උපකාරක දුරකථන සේවයට 2020 වර්ෂයේ ලැබුණු වැඩිම පැමිණිලි සංඛ්‍යාව පදනම් කරගෙන තිබුණි. වැඩි පැමිණිලි සංඛ්‍යාවක් කොළඹ, ගම්පහ කළුතර, දිස්ත්‍රික්ක වලින් වාර්තා වී තිබුණද සාපේක්ෂව අඩු පැමිණිලි සංඛ්‍යාවක් ලැබුණු කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබීම තුලින් පවුල් තෝරා ගැනීමේ පදනම විනිවිදභාවයකින් තොරවිය.	කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආවරණය වන පරිදි අනාරක්ෂිත පවුල් හඳුනාගැනීම හා සුපරීක්ෂක කමිටු සවිමත් කර බලාත්මක කිරීම යටතේ කාන්තා හා ළමා සංවර්ධන ඒකකයන් සංවර්ධනය සඳහා උපකරණ මිලදී ගැනීම සහ එම අනාරක්ෂිත පවුල් සඳහා වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් **2021** වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.**2,901,000** ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු බව.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම විධිමත් පදනමක් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි සිදුවන බවට වගබලා ගැනීමට කටයුතු කළ යුතුය .
(ආ)	සතුටු පවුල ව්‍යාපෘතිය සඳහා මුළු ප්‍රතිපාදන මුදල රු.මිලියන 2.9 ක් වුවත්, 2024 දෙසැම්බර් 31 දිනට වැය කරන ලද රු.මිලියන 2.8 ක මුදල සතුටු පවුල ව්‍යාපෘතිය හරහා පවුලේ ආර්ථික තත්වය වැඩිදියුණු කිරීම, යහපත් පුරුදු ප්‍රවර්ධනය කිරීම, මානසික තෘප්තිය හා පවුලේ සහයෝගීතාවය වර්ධනය සහ අයහපත් පුරුදු වලින් මුදවා ගැනීම යනාදී අරමුණු ලගා කර ගැනීම සඳහා වැය නොකර එම අරමුණු වලින් බැහැරව උපකරණ මිලදී ගැනීම, සැසි පැවැත්වීම, සම්පත්දායක දීමනා ගෙවීම හා නිලධාරී දීමනා ගෙවීම වෙනුවෙන් පමණක් යොදවා තිබුණි.	කුරුණෑගල හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකී වැඩසටහන් මඟින් චර්යාවන් වෙනස් කිරීමට අරමුණු කර ඇතත් එකී අරමුණ නිසි පරිදි ඉටු නොවන බැවින් තවදුරටත් මෙම ව්‍යාපෘති සිදු නොකිරීමට හිටපු අමාත්‍යාංශ ලේකම් දැනුම් දී තිබුණි. කාන්තා හා ළමා සංවර්ධන ඒකකයන්හි නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා මෙම උපකරණ ලබා දී ඇති අතර, විවිධ මාතෘකා යටතේ දැනුවත්භාවය වැඩි කිරීමට වැඩසටහන් සිදු කර ඇත. කෙසේ වෙතත් ඉදිරි වැඩසටහන් සම්පාදනයේදී මෙවැනි තත්වයන් ඇතිවීම වලක්වා ගැනීමට කටයුතු කරන බව.	ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ලැබෙන බව තහවුරු කරගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ)	2021 වර්ෂයේ සිට 2025 දක්වා සිදු කිරීමට අපේක්ෂිත සතුටු පවුල ව්‍යාපෘතිය එක් වසරකින්ම නිමා කර තිබූ අතර අපේක්ෂිත පරිදි ග්‍රාමීය අනාරක්ෂිත ප්‍රජාවට ප්‍රතිලාභ ලැබී නොතිබුණි.	වැඩසටහනේ මූලික සංකල්පය යටතේ ග්‍රාමීය ප්‍රජාවගේ පවුල්වල තෘප්තිමත්භාවය වැඩිවීම සඳහා සෘජුවම හා ප්‍රමාණවත් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර නොමැතිවීම හා සෘජුවම ඉලක්ක ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ ගලා නොයන බැවින් **2022** දෙසැම්බර් **30** දින වැඩසටහන අවසන් කර ඇති බව.	-එම-

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුලදී "දිවියට අරුතක් වැඩසටහන" සඳහා රු.මිලියන 3.5 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 60 ක් විය. විගණිත දිනය වන විට ව්‍යාපෘති 40 ක් සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සති 08 ක් ඇතුලත එක් එක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කළයුතු වුවද ව්‍යාපෘති 02 ක් පමණක් නිමකර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය මුළු දිවයිනෙහිම සියළු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මක කළයුතු වුවත් විගණිත දිනය වනවිට රු.මිලියන 3.2 ක් වියදම් දරා තිබුණද, දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 10 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	වැඩසටහන යටතේ **2024** වසර සඳහා ව්‍යාපෘති **64** ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරන ලද අතර**,** එහි **2024** දෙසැම්බර් **31** දිනට භෞතික ප්‍රගතිය සියයට **100** ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට **99.2** ක් වූ බව.	ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ලැබෙන බව තහවුරු වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	දිවියට අරුතක් වැඩසටහන මඟින් භාණ්ඩ හා උපකරණ ප්‍රතිලාභීන් වෙත විධිමත් පරිදි නිවැරදි වටිනාකමෙන් හා ප්‍රමාණයෙන් ලැබුණේද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය අත්සන් ලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ අරමුණ සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම වුවද, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ආර්ථිකය යම් මට්ටමකට පවත්වාගෙන යනු ලබන මාසිකව සැලකියයුතු ආදායමක් ලබන ව්‍යවසායිකාවන් සඳහාද ආධාර ලබාදී තිබුණි.	වැඩසටහන්වලට අදාලව උපකරණ හා භාණ්ඩ බෙදාදීම සම්බන්ධව ලිඛිත උපදෙස් ලබා දී ඇති අතර දැනට එම උපදෙස් පරිදි වියදම් සාරාංශ හා උපකරණ බෙදාදීම විස්තර ලැබෙමින් පවතින බව.	ව්‍යාපෘති ප්‍රතිලාභ විධිමත් පරිදි ප්‍රතිලාභීන් වෙත ලබාදුන් බවට තහවුරු කිරීමේ සාක්ෂි පවත්වාගෙන යායුතු වන අතර ව්‍යාපෘතියේ අරමුණු වලට ගැලපෙන පරිදි ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

4.3 විදේශ ආධාර ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සාර්ක් ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ක් යටතේ උප ක්‍රියාකාරකම් 08 ක් සඳහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 14.45 ක මුදලක් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රියාකාරකම් 03 ක කිසිදු මූල්‍ය ප්‍රගතියක් ලබා නොතිබූ අතර, තවත් ක්‍රියාකාරකම් 03 ක මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 1, 2 හා 5 ක් වී තිබුණි.	පිළිතුරු ලබාදී නැත.	විදේශ ණය / ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් , ඵලදායීතාවයෙන් හා ආර්ථිකමය වශයෙන් උපරිම වාසි සහගත ලෙස වියදම් කිරීමට කටයුතු කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බහුකාර්ය වර්ණ ලේසර් වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද උපයෝජන විස්තර (consumable details) තාක්ෂණික ඇගයීම් කමිටු පිරිවිතරවල ඇතුළත් මාදිලියට අයත් නොවන මාදිලියේ යන්ත්‍රයක් වූ අතර එහි වර්තමාන වෙළඳපොල වටිනාකම රු.මිලියන 0.2 ත් රු.මිලියන 0.3 ත් අතර මිලක් වී තිබුණද, 2024 නොවැම්බර් 12 දින රු.මිලියන 0.8 ක් වූ වැට් සහිත මිලකට එම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි.	අමාත්‍යාංශය විසින් මිලදී ගැනීමට තීරණය කරන ලද යන්ත්‍රය පිරිවිතර ලේඛනයේ වර්ණ ඡායාපිටපත් යන්ත්‍රයක් ලෙස **(Colour Laser Multifunction Photocopy Machine)** පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව වර්ණ ඡායාපිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කර ඇති බව.	පිරිවැය ඇස්තමේන්තු තුළ තාක්ෂණික ඇගයීම් කමිටු පිලිවිතර අනුව මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	බහුකාර්ය වර්ණ ලේසර් වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රය මිලදී ගැනීමට අදාළ ලංසු ලියවිලි, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා හා ප්‍රසම්පාදන තීරණ පරීක්ෂාවේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 හා 2.6 ඡේද ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ වගකීම් හා කාර්යභාරයන් ඉටුකර නොතිබුණි.	ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයුම් කමිටුවට තේරී පත්වන නිලධාරීන්ට තම කාර්යභාරය හා වගකීම් පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කරන මෙන් දැනුවත් කර ඇති බව.	මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 හා 2.6 ඡේද ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු වල වගකීම හා කාර්යභාරයන් නිසි පරිදි ඉටුවන බව ගණන්දීමේ නිලධාරී විසින් පරීක්ෂාකර අදාළ වන පරිදි ලිඛිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015 ජුනි 08 දින ගංවතුරට හසුවීමෙන් හානි වූ ජීප් රථයක් සඳහා රු.මිලියන 6.8 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.මිලියන 3.4 ක් පමණක් හානිපූර්ණය කර තිබුණි. රක්ෂණ සංස්ථාවෙන් නොලැබුණු රු.මිලියන 3.4 ක් වූ ඉතිරි මුදල වසර 07 කට පසු එනම් 2021 දෙසැම්බර් 30 දින අමාත්‍යාංශය විසින් ගෙවා 2022 ජනවාරි 13 දින රථය නිදහස් කර ගෙන තිබුණි. අනතුර සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට නිසි අවස්ථාවේදී කටයුතු නොකිරීම නිසා අලාභයට නිලධාරීන්ගේ ප්‍රමාදයන් හේතුවී ඇති බව අමාත්‍යාංශ කමිටුවක් මගින් වාර්තා කර තිබුණි. ඒ අනුව රජයට සිදුවී ඇති අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.	ජීප් රථයේ අලාභය පිළිබඳව නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත් කර අලාභය කපා හැරීමට නිර්දේශ කර ඇත. ඒ අනුව අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇත. ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බව	නොසැලකිලිමත්කම මත සිදුවූ අලාභයන් අයකර ගැනීමට මුදල් රෙගුලාසි 103 අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2014 වර්ෂයේදී ජීප් රථයක් අනතුරකට භාජනය වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4)ට පටහැනිව අනතුර සිදු වී වසර 10 කට පසු එනම් 2024 ජනවාරි 02 දින පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර එහි සිදු වූ අලාභය පිළිබඳ තක්සේරු කර නොතිබුණි. තවද අනතුර සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකුගේ වාර්තාවක්ද ලබා ගෙන නොතිබුණු අතර හානිපූර්ණය කිරීම සම්බන්ධයෙන් ගත යුතු නිසි ක්‍රියාමාර්ග කාලීනව නොගැනීම හේතුවෙන් මෙම අලාභය ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි වී තිබූ අතර 2024 දෙසැම්බර් 18 වන දින විටත් ජීප් රථය දිරාපත් වන පරිදි අනාරක්ෂිතව ගාල් කර තිබුණි.	පිළිතුරු ලබාදී නැත.	නියමිත කාල වකවානු තුළ අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීම පැහැරහැර ඇති නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103 අනුව කටයුතු කළ යුතුය.

(ඇ) වටිනාකම රු.මිලියන 98.9 ක් වූ ලෝක බැංකු ණය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක ආබාධ තැනැත්තන් සඳහා වූ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් 2023 වර්ෂයේදී ඉදිකර තිබුණද අදාළ ඉඩම නිසි පරිදි පවරා නොගැනීම හේතුවෙන් විදුලිය හා ජලය මෙම මධ්‍යස්ථානයට ලබා ගත නොහැකි වී තිබුණි. ඒ අනුව 2023 ජූනි 14 දින සිට 2025 අප්‍රේල් 11 දින දක්වා මෙම මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද වහලයෙන් වතුර කාන්දු වීම හේතුවෙන් බිත්ති කිහිපයක් හා වහලයේ සිවිලිමේ කොටසක් දූර්වර්ණව පැවතීම නිසා ගොඩනැගිල්ල දිරාපත් වීමේ අවදානමක් පෙන්නුම් කර තිබූ අතර ගොඩනැගිලි පරිශ්‍රයට පිවිසීමේ මාර්ගයද ඉතා අබලන් තත්ත්වයක පැවතුණි.	**2018** මැයි **10** දිනැති අංක අමප/**18/0755/711/015** දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව දකුණු පළාතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් අකුරැස්ස බුබ්බුලවත්ත ප්‍රදේශයේ ලෝක බැංකු ආධාර යටතේ ඉදිකරන ලදී. විධිමත් පරිදි තනතුරුවලට බඳවා ගැනීමෙන් අනතුරුව හා දූර්වර්ණ වූ සිවිලිම හා බිත්ති පිළිසකර කර මෙහි කටයුතු ආරම්භ කරන බව.	ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇති බව තහවුරු කරගෙන ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

4.6 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වසර 05 කට වඩා වැඩි අලාභ හානි සිදුවීම් අවස්ථා 03 කට අදාළ වටිනාකම වූ රු.මිලියන 5.6 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නැත.	කඩිනමින් අලාභහානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.7 කළමනාකරණ දූර්වලතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය **17(2)** ව්‍යවස්ථාව අනුව කමිටු සාමාජිකයින් **15** දෙනෙකුගෙන් යුත් ජාතික කාන්තා කමිටුව මාස දෙකකට වරක් හෝ අවශ්‍යතා අනුව හැකිතාක් නිරතුරුව රැස්විය යුතු වුවත් වසර **2 ½** කින් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණු අතර ප්‍රඥප්තියට අදාළව මෙහෙයුම් කමිටු සාමාජිකයන් පත්කිරීම් සිදුවී නොමැතිවීම හේතුවෙන් මෙහෙයුම් කමිටු අධීක්ෂණයන් හා	අදාල විධායක සභාපති ජනාධිපති විසින් පත් කළ යුතු අතර එය මෙතෙක් පත් කර නැති බව.	ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තියේ 17 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික කාන්තා කමිටුව පිහිටුවීමට කටයුතු කළ යුතුය.

	අනුකමිටු රැස්වීම්ද පවත්වා නොතිබුණි.		
(ආ)	පාරම්පරික කර්මාන්ත වල යෙදෙන්නන්, ස්වයං රැකියා වල යෙදෙන අඩු ආදායම්ලාභීන් හා නිෂ්පාදන ආදායම් නොමැති හා මුදල්, තාක්ෂණය හා වෙළඳපොළ සොයා ගත නොහැකි කුඩා ව්‍යවසායකයන් නිෂ්පාදනයේ ප්‍රබල කොටස්කරුවන් කර ගනිමින් තෝරාගත් ගම්මාන වල ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිහිටුවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා නව නිෂ්පාදන ගම්මාන හා පැවති නිෂ්පාදන ගම්මාන වැඩි දියුණු කිරීම් වෙනුවෙන් රු.මිලියන 2563.89 ක සමස්ත වියදමක් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් දරා තිබුණද එම ගම්මාන පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නිෂ්පාදන ගම්මාන වලද දත්ත ලබා ගනිමින් සුදුසු පරිදි දත්ත පද්ධතියක් සකස් කිරීමට කාර්යාංශය කටයුතු කරමින් පවතින බව.	දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 වර්ෂයේ ප්‍රතිලාභීන් 602 ක් සඳහා ආරම්භ කළ ව්‍යාපෘති 11 ක් 2025 අප්‍රේල් 09 දින වනවිට සම්පූර්ණයෙන්ම අක්‍රියව තිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වන බව .	ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන් වෙත ලැබෙන පරිදි ව්‍යාපෘති සක්‍රීය තත්ත්වයෙන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.

(ඇ)	2024 වර්ෂයේ නව නිෂ්පාදන ගම්මාන 45 ක් ක්‍රියාත්මක කර තිබූ අතර ඉන් 16 ක් එනම් නව ව්‍යාපෘති වලින් සියයට 33 ක් පමණ කළුතර දිස්ත්‍රික්කය වෙත ලබා දී තිබුණු අතර ඉන් ව්‍යාපෘති 08 ක්ම එකම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට (මතුගම) ලබාදී තිබුණි.	නිරීක්ෂණයන් සමග එකඟ වෙමි. මෙම ව්‍යාපෘති **08** සාර්ථකව සිදු කිරීම අරමුණු කර ගනිමින් ප්‍රතිලාභීන් **400** ක් සඳහා කුරුඳු පැළ ලබා දීම වෙනුවෙන් රු.මිලියන **11.15** ක ප්‍රතිපාදන මුදලක් වැය කරන ලදී. මේ වන විට ප්‍රතිලාභී සංඛ්‍යාව **591** දක්වා වර්ධනය කර ගනිමින් මෙම ව්‍යාපෘති **08** සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව.	ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ අපේක්ෂිත පුද්ගලයින් සිටින සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.